සැ. යු. - 2012.06.18 දින පළ වූ අංක 1,762 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,763 - 2012 ජුනි මස 15 වැනි සිකුරාදා - 2012.06.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 810 | රජයේ නොවන දැන්වීම් ... ... ... | 813 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 810 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 817 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

775 - B 80619— 8,900 (2012/06)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ගර්හිත වාහන හා ඇඳු රථ විකිණීම සඳහා ලංසු කැඳවීම**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පාවිච්චි කරන ලද ඩබල් කැබ් රථ දෙකක්, ජීප් බවුසර් දෙකක්, ජීප් රථ දහ අටක් සහ ජීප් ට්‍රේලරයක් විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදාළ ලංසු පත්‍ර කොළඹ 05, නාරාහේන්පිට, කිරුල පාරේ, අංක 150 හි පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ප්‍රවාහන අංශයේ පරිපාලන නිළධාරිනී වෙතින් ලබා ගත හැකි අතර ඒ සඳහා ආපසු නොගෙවන රු. 500 ක ගාස්තුවක් ගෙවිය යුතු ය. ලංසු පත්‍ර 2012.07.05 වැනි දින පස්වරු 2.45 තෙක් ලබාගත හැකිය.

03. ගැණුම්කරුවන්ට තම හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව ඩබල් කැබ් රථ දෙක ත්‍රිකුණාමලය හා අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වල දී ද, ජීප් බවුසර් දෙක ගිරිතලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ දී හා දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේ දී ද, ජීප් රථ රත්නපුර, කළුතර, මහනුවර, අනුරාධපුරය, මොණරාගල හා ගම්පහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වලදී හා ගල්ගමුව ගාල්ල, අකුරැස්ස, ලුණුගම් වෙහෙර, දඹුල්ල, කිලිනොච්චිය, පන්නල, මහඔය, තඹුත්තේගම, අත්තනගල්ල, මීරිගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල දී ද, ජීප් ට්‍රේලරය හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ දී ද සතියේ වැඩ කරන දින උදේ 9.00 සිට 3.00 අතර කාලය තුළ දී පරීක්ෂා කර බැලිය හැක.

04. එක් එක් රථය සඳහා වෙන වෙනම සකස් කළ ලංසු පත්‍ර, කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙළවරේ "අංක ................ දරන රථය මිළ දී ගැනීම" යනුවෙන් සඳහන් කර එක් එක් රථය වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 3,000 ක තැන්පතු මුදලක් ලංසු සුරක්ෂණය වශයෙන් මෙම කාර්යාලයේ සරප් නිළධාරි වෙත 2012.07.05 දින සවස 2.45 ට පෙර ගෙවා ලබා ගන්නා රිසිට් පතෙහි පිටපතක් අමුණා රිසිට්පත් අංකය ලංසු පත්‍රයේ සඳහන් කර 2012.07.06 දින පෙරවරු 10.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් ඉහත ලිපියට එවිය හැකි අතර නැතහොත් ප්‍රවාහන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියේ ද බහාලිය හැක.

05. සියලුම රථ විකිණීමේ දී ඉදිරිපත් වන ලංසු සඳහා 12% වැට් බද්දක් අය කරනු ඇත.

06. ලංසු භාර ගැනීම 2012.07.06 දින පෙරවරු 10.00ට අවසන් කරන අතර එදිනම පෙ. ව. 10.15 ට ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු හෝ ඇයගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

07. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් වී ඇති ලංසු ප්‍රතික්ෂේප කරන අතර මෙම විකිණීම හා සබැඳි කරුණු පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

එස්. එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
සර්වේයර් ජනරාල්.
දුරකථන අංක : 011-2587925,
011- 2369011, 2369012. (දිගුව 381)

ප්‍රවාහන අංශය,
අංක 150, කිරුල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

06-470

# බඩු බාහිරාදිය විකිණීම්

**පොලිස් දෙපාර්තමේන්තුව මාතර කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ මාතර කොට්ඨාසයට අයත් පොලිස් ස්ථාන සහ කාර්යාලවල පාවිච්චි කර ගර්හිත කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම. 2012 ජූලි මස 06 වැනි දින පැය 0900 ට මාතර පොලිස් අධිකාරි කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ.

2012 ජූලි මස 05 වැනි දින පැය 1300 සිට පැය 1600 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි භූමියට ඇතුලුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතුයි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිල දී ගනු ලැබූ භාණ්ඩ 2012 ජූලි මස 06 වැනි දින පැය 1600 පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩල විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ටී. එම්. ඩබ්. ඩී. තෙන්නකෝන්,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
මාතර කොට්ඨාසය.

### උපලේඛනය

| අනු. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | ඇලුමිනියම් බන්දේසි | 02 |
| 02. | ඇලුමිනියම් ජෝගු | 04 |
| 03. | බාල්දි | 03 |
| 04. | බන්දේසි (තේ) | 05 |
| 05. | බොයිලේරු | 01 |
| 06. | ෆැක්ස් මැෂින් | 01 |
| 07. | ගුවන් විදුලි යන්ත්‍ර | 02 |
| 08. | ගෑස් සිලින්ඩර් | 01 |
| 09. | ගෑරුප්පු | 01 |
| 10. | ඉබියතුරු | 23 |
| 11. | කල්දේරම් | 19 |
| 12. | කැල්කියුලේටර් | 01 |
| 13. | කතුරු (රෙදි කපන) | 04 |
| 14. | මහ පිහි | 04 |
| 15. | මේස හැඳි | 10 |
| 16. | මල්ටි පොට් | 02 |
| 17. | නියර් කටර් | 01 |
| 18. | නිල නිවාස යතුරු | 112 |
| 19. | පා පැදි | 05 |
| 20. | පිකැස් (පස් බුරුල් කරන) | 06 |
| 21. | රූපවාහිනී (වර්ණ) | 03 |
| 22. | රූපවාහිනී ඇන්ටනා | 01 |
| 23. | රේක්ක | 01 |
| 24. | සාස්පාන් | 23 |
| 25. | තාච්චි | 06 |
| 26. | තේ හැඳි | 16 |
| 27. | තණකොළ කපන කතුරු | 02 |
| 28. | උදළු තල | 06 |
| 29. | විදුලි කේතල | 06 |
| 30. | වතුර ෆිල්ටර් | 02 |
| 31. | විදුල පංකා (සීලිං) | 03 |
| 32. | වතුර මෝටර් | 02 |
| 33. | විදුලි පංකා (සිටුවන) | 01 |
| 34. | විදුලි පංකා (මේස) | 10 |
| 35. | වානේ කැබිනට් | 09 |
| 36. | විදුලි පන්දම් | 04 |
| 37. | විදුලි හීටර් | 01 |
| 38. | විසි කැති | 06 |
| 39. | වානේ පොත් රාක්ක | 01 |
| 40. | විල් බැරෝ | 01 |
| 41. | යතුරු ලියන (සිංහල) | 03 |
| 42. | යතුරු ලියන (ඉංග්‍රීසි) | 03 |
| 43. | යකඩ පුටු | 30 |
| 44. | යකඩ අල්මාරි | 02 |
| 45. | යකඩ කැබිනට් | 01 |
| 46. | පිහියා | 04 |
| 47. | පරිගණක යන්ත්‍ර | 01 |
| 48. | පින්ටර් | 01 |
| 49. | පරිගණක පුවරු (යතුරු) | 01 |
| 50. | හිරමන | 01 |

06-564

---

## බිබිල මහෙස්ත්‍රාත් අධිකරණය

### රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජ සන්තක කිරීමට යටත් වූ හා හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2012 ජූලි මස 07 වැනි දින පෙ. ව. 10.00 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

මෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් යමකට හිමිකම්පාන්නෙකු වේ නම් වෙන්දේසි දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා නිරීක්ෂණය කිරීමට කටයුතු කළ හැකිය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එකී අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදිනම ඉවත් කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම් කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය.

ජී. ටී. එම්. උද්දාල සුවඳුරුගොඩ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බිබිල.

2012 ක් වූ මැයි මස 21 වැනි දින,
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

භාණ්ඩ ලැයිස්තුව

| අනු අංක | නඩු අංකය | නඩු භාණ්ඩ විස්තරය | තක්සේරු වටිනාකම මුදල රුපියල් |
|---|---|---|---|
| 01. | 14656 | අංක U. P. S. D. 5181 සී හැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය | |
| 02. | 13377 | අංක U. P. J. N. 5945 දරන අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය | |
| 03. | 1376 | අංක 149-7316 වැලි වර්ගයේ කුඩා යතුරුපැදිය හා ඊට සවිකර ඇති තහඩු පෙට්ටිය | |
| 04. | 6984 | අංක S. P. J. V. 7369 බජාජ් වර්ගයේ යතුරුපැදිය | |
| 05. | නඩු අංක රහිත | ලොකු ට්‍රැක්ටර් ට්‍රේලරය | |
| 06. | 25699 | රොබින් වතුර මෝටරය | |
| 07. | 7126 | රොබින් වතුර මෝටරය | |
| 08. | 10023 | රොබින් වතුර මෝටරය | |
| 09. | 7126 | රොබින් වතුර මෝටරය | |
| 10. | නඩු අංක රහිත | ලී මිට සහිත උදලු කිහිපයක් | |
| 11. | නඩු අංක රහිත | ලී මිට සහිත සවල් කිහිපයක් | |
| 12. | නඩු අංක රහිත | කියත් සහ තල කිහිපයක් | |
| 13. | නඩු අංක රහිත | ලන්ඩා අලවංගු කිහිපයක් | |
| 14. | නඩු අංක රහිත | පිහියා තල කිහිපයක් | |
| 15. | නඩු අංක රහිත | ඇදුම් උදලු කිහිපයක් | |
| 16. | නඩු අංක රහිත | හිස් බූලි තොගයක් | |
| 17. | නඩු අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් තොගයක් | |
| 18. | නඩු අංක රහිත | මහෙස්ත්‍රාත්තුමාගේ වාහනයෙන් ඉවත් කළ ගෙවී ගිය ටයර් කිහිපයක් | |
| 19. | නඩු අංක රහිත | ලොරි රථ ටයර් 01යි | |
| 20. | නඩු අංක රහිත | යකඩ බාල්දි කිහිපයක් | |
| 21. | නඩු අංක රහිත | ඇලුමිනියම් තල 02යි | |
| 22. | 7356 | ඇලුමිනියම් මුට්ටි 01යි | |
| 23. | නඩු අංක BR 125/09 | ඇලුමිනියම් මුට්ටි 01යි | |
| 24. | නඩු අංක 11745 | ඇලුමිනියම් යකඩ තාච්චි 01යි | |
| 25. | නඩු අංක 19488 | ඇලුමිනියම් කොරොස් 01යි | |
| 26. | නඩු අංක රහිත | බදාම යකඩ තාච්චි කිහිපයක් | |
| 27. | නඩු අංක 11717 | ටකරන් තහඩු 02යි | |
| 28. | නඩු අංක 20016 | කුලු ගෙඩි 01යි | |

06-489

---

## පොලිස් අධිකාරී කාර්යාලය - ගම්පහ

### පාවිච්චි කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ පොලිස් කොට්ඨාසයේ නිළධාරීන් සහ පොලිස් ස්ථාන හා පොලිස් කාර්යාලවල පාවිච්චි කිරීමෙන් පසු ප්‍රාදේශීය ගබඩාවට භාර දෙන ලද පහත සඳහන් අභිලි භාණ්ඩ 2012.06.27 වැනි දින පෙ. ව. 10.00 ට ගම්පහ දිසා ගබඩා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

පොලිස් අධිකාරී,
ගම්පහ.

| | භාණ්ඩයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 01. | සිංහල යතුරුලියන | 18 |
| 02. | ඉංග්‍රීසි යතුරුලියන | 08 |
| 03. | පාපැදි | 34 |
| 04. | පරිඝණක යන්ත්‍ර | 01 |
| 05. | පරිඝණක මොනිටර් | 01 |
| 06. | පරිඝණක ප්‍රින්ටර් | 01 |
| 07. | යූ. පී. එස්. යන්ත්‍ර | 02 |
| 08. | අඟල් 21 වර්ණ රූපවාහිනි | 01 |
| 09. | කැසට් රේඩියෝ යන්ත්‍ර | 01 |
| 10. | අනු පිටපත් යන්ත්‍ර | 01 |
| 11. | වායු සමීකරණ යන්ත්‍ර | 01 |
| 12. | අධි ශීතකරණ යන්ත්‍ර | 01 |
| 13. | යකඩ පුටු | 52 |
| 14. | යකඩ කුෂන් පුටු | 36 |
| 15. | රූපවාහිනි ඇන්ටනා | 01 |
| 16. | වතුර පිල්ටර් | 02 |
| 17. | විදුලි කේතල | 02 |
| 18. | වතුර බොයිලේරු | 08 |
| 19. | වතුර මෝටර් | 03 |
| 20. | මල්ටි පොට් | 01 |
| 21. | මේස විදුලි පංකා | 03 |
| 22. | ගෑස් කුකර් | 01 |
| 23. | වානේ කැබිනට් | 10 |
| 24. | වානේ අල්මාරි | 01 |
| 25. | ගිනි නිවන උපකරණ | 02 |
| 26. | ගෑස් ලාම්පු | 01 |
| 27. | සිවිලිං විදුලි පංකා | 10 |
| 28. | ගෑස් සිලිටර් කුඩා | 01 |
| 29. | අඩි 04 ටියුබ් ලයිට් සෙට් | 31 |
| 30. | ෆැක්ස් යන්ත්‍ර | 05 |
| 31. | යකඩ පෙට්ටි | 03 |
| 32. | විධායක පුටු | 01 |
| 33. | සාස්පාන් කුඩා | 02 |
| 34. | කල්දේරම් ලොකු | 01 |
| 35. | කල්දේරම් කුඩා | 04 |
| 36. | ඇලුමිනියම් කේතල | 01 |
| 37. | එමජන්සි ලයිට් | 01 |
| 38. | සිටුවන විදුලි පංකා | 04 |
| 39. | සවල් | 01 |

| භාණ්ඩයේ නම | ප්‍රමාණය |
|---|---|
| 40. ගණන් එකතු කිරීමේ යන්ත්‍ර | 05 |
| 41. විසි කැති | 01 |
| 42. මේස පිහි | 03 |
| 43. ගල් ඉනි | 01 |
| 44. උදලු තල | 03 |
| 45. රේක්ක | 01 |
| 46. මන්නා පිහි | 02 |
| 47. ලන්තෑරුම් | 03 |
| 48. ගැල්වනයිස් බාල්දි | 02 |
| 49. පාපැදි ස්ටෑන් | 19 |
| 50. පාපැදි ලොක් | 05 |
| 51. පාපැදි ඩයිනමෝ | 10 |
| 52. ටිප් සුවිච් | 01 |
| 53. ජෝගු කුඩා | 01 |
| 54. ජෝගු ලොකු | 01 |
| 55. කාර්යාල සීනු | 02 |
| 56. ඇණ රහිත පෙට්ටි | 01 |
| 57. කුඩා යකඩ පෙට්ටි | 01 |
| 58. මේන් සුවිච් | 01 |
| 59. අත් මුල්ලු | 01 |
| 60. මේස මයික් ෆෝන් | 01 |

01. මිල දී ගන්නා සියලුම භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවිය යුතු අතර මුදල් චෙක්පත් මගින් භාරගනු නොලැබේ.

02. මිල දී ගන්නා භාණ්ඩ ප. ව. 4.00 ට පෙර ගබඩා භූමියෙන් ඉවත් කර ගත යුතු අතර ඉවත් කර නොගන්නා භාණ්ඩ සඳහා වග කියනු නොලැබේ.

03. මෙම භාණ්ඩ 2012.06.26 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 04.00 දක්වා වූ කාලය තුළ ගබඩා භූමියේ දී මහජනතාවට පරීක්ෂා කර බැලීමට පුළුවන.

පොලිස් අධිකාරී,
ගම්පහ.

06-454

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොටියාකුඹුර, මල්මඩුව පාර, මඩිගේ නිවස හි පදිංචි මොහමඩ් හාදි අහමඩ් ෆවුසි වන මම, 2009.11.27 වැනි දින නීතිඥ ඒ. එල්. එම්. අසාර් නොතාරිස් තැන සහතික කළ අංක 3104 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් වලංගු බව සහතික කොට කොටියාකුඹුර, මඩිගේ නිවස පදිංචි ඉස්මායිල් ලෙබ්බෙ සුදත් උම්මා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කරන බව මෙයින් නිවේදනය කරමි.

මේ අනුව අදාළ, සියලු පාර්ශවයන්ට නිවේදනය කරන වග නම්, ඉහත සඳහන් ඇටෝර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් 2012.05.10 වැනි දින සිට මා විසින් වග නොකියන බව මෙයින් දැනුම් දෙමි.

එම්. එච්. ඒ. ෆවුසි,
(ඇටෝර්නි අධිපති).

06-601

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සිල්ක්වේ ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 මැයි මස 11 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සිල්ක්වේ ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85906
ලියාපදිංචි ලිපිනය : අංක 23/40, "රත්නපාලී", මෛත්‍රී මාවත, ඒකල, ජාඇල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8244495/077-8197041.
06-597

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව නතික් ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 මැයි මස 15 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : නතික් ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85977
ලියාපදිංචි ලිපිනය : 62, මාතලේ පාර, අඹතැන්න.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8244495/077-8197041.

06-598

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පරණවිතාන කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 මැයි මස 15 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : පරණවිතාන කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85952
ලියාපදිංචි ලිපිනය : වලහන්දුර හංදිය, ආතංගොඩ, ගාල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ප්‍රවර්ධකයෝ.

දුරකථන අංක : 071 8244495/077-8197041.
06-599

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔප්ටිමම් ඔරිජිනලිටි කුන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 මැයි මස 15 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔප්ටිමම් ඔරිජිනලිටි කුන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85963
ලියාපදිංචි ලිපිනය : අංක 93/ඒ/3, පල්ලෙමුල්ල පාර, අමුහේන්කන්ද, පරකඩුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8244495/077-8197041.

06-600

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ද යුනික් ට්‍රැවල් (පුද්ගලික) සමාගම
අංකය : පී වී 85871
දිනය : 2012.05.10
ලියාපදිංචි ලිපිනය : අංක 8 ඒ, දූවන පාර, කොච්චිකඩේ
සමාගම් ලේකම් : සී මැතිව් ඇන්ඩ් කො. (පුද්ගලික) සමාගමෙහි සී. පාලිත ජේ. ඩබ්ලිව්. මැතිව් එස්ඊසී/1159/94.

06-603

## සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තරය

2007 අංක 07 දරන සමාගම් පනත 09 (1) වැනි වගන්තිය අනුව පහත විස්තරය දැක්වෙන ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කර ඇතඃ-

සමාගමේ නම : ලංකා විෂන් සේවර්ස් ෆවුන්ඩේෂන් (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ ලිපිනය : අංක 262, කොළඹ පාර, ගම්පහ
ලියාපදිංචි අංකය : ජී. එල්. 2194
ලියාපදිංචි දිනය : 2012.05.17.

සමාගම් ලේකම්.

06-596

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2012 මැයි මස 23 වැනි දින සිට ලියාපදිංචි කර ඇතඃ-

සමාගමේ නම : SUSTAINABLE LUXURY LANKA (PRIVATE) LIMITED
ලියාපදිංචි අංකය : පී වී 86137
ලියාපදිංචි ලිපිනය : අංක 9/5, තම්බයියා ඇවනියු, කොළඹ 07.

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවනියු,
කොළඹ 07.

06-595

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදීඃ-

සමාගමේ නම : සෙන්ස් ග්‍රැෆික් සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 66914
ලියාපදිංචි කාර්යාලය : අංක 917/2, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ.

06-566

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙහිවල, කළුබෝවිල, රෝහල පාරේ, අංක 288 (කලින් අංක 43, ශ්‍රී තොටගම වාචිස්සර මාවත) හි පදිංචි රයිගම විදානලාගේ කුසුමාවතී පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංක 357930138 V ) වන මා විසින් ඉහත කී ලිපිනයේ ම පදිංචි සෙල්ලප්පෙරුමලාගේ නිමල් පතිරාජ (ජාතික හැඳුනුම්පත් අංක 501473073 V) යන අයට ලබා දී ඇති, ප්‍රසිද්ධ නොතාරිස් කොළඹ අධිකරණ කලාපයේ රන්ජන් දගම්පත් ජයසේන මහතා විසින් 1996 සැප්තැම්බර් මස 02 වැනි දින ලියූ අංක 206 දරන ඇටෝර්නි බලපත්‍රය 2012.05.31 වැනි දින සිට අවලංගු කරන බව ද, මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මා වග නොකියන බව ද, ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ආර්. කේ. පෙරේරා,
(රයිගම විදානලාගේ කුසුමාවතී පෙරේරා).

06-561

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

ඩී. වී. කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් 2012.05.10 වැනි දින අංක පී වී 85861 යටතේ සංස්ථාගත කරන ලදී.
ලියාපදිංචි ලිපිනය : "සම්රු", අංක 70, සල්ගහමුල පාර, පහල බෝමිරිය, කඩුවෙල.

ආර්. ආර්. එම්. එච්. කලුහෙන්දිවෙල,
සමාගම් ලේකම්.

06-482

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය, ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : නෙක්ස්ජන් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 86027
ලියාපදිංචි ලිපිනය : ගන්ලත්ස් බාරේ, ගලදාරි හෝටලය, අංක 64, ලෝටස් පාර, කොළඹ 01
සංස්ථාගත කළ දිනය : 2012 මැයි 23.

සමාගම් ලේකම්වරු,
ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ගලදාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

06-492/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය, ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : ග්ලෝබ්ෂිප් ලෝජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 86180
ලියාපදිංචි ලිපිනය : "පර්ෂිප් හවුස්", අංක 72 සී, බෞද්ධාලෝක මාවත, කොළඹ 04
සංස්ථාගත කළ දිනය : 2012 මැයි 25.

සමාගම් ලේකම්වරු,
ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ගලදාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

06-492/2

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය, ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : මැක්ලැන්කන් ගෘෆයිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වි 86050
සංස්ථාගත කළ දිනය : 2012 මැයි මස 18 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 29/1, බෙල්මොන්ට් වීදිය, අළුත්කඩේ, කොළඹ 12.

අධ්‍යක්ෂ.

06-491

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය, ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : සී/ස ග්‍රීන්අර්ත් ලංකා (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 85590
ලියාපදිංචි කළ දිනය : 2012.04.23
ලියාපදිංචි ලිපිනය : අංක 86/5, වීර මාවත, දෙපානම, පන්නිපිටිය.

සමාගමේ අධ්‍යක්ෂ.

06-495

---

## සමාගමේ නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ නාමය වෙනස් කිරීම පිළිබඳ නිවේදනයයි

සමාගමේ පෙර පැවති නාමය : කොමර්ෂල් කෙඩිට් පීඑල්සී
සමාගමේ ලියාපදිංචි අංකය : පීබී 269 පීකිව්
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 106, යටිනුවර වීදිය, නුවර
සමාගමේ නව නාමය : කොමර්ෂල් කෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

කොමර්ෂල් කෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙනුවෙන්,

ජේසී ඇන්ඩ් කම්පනි,
සමාගම් ලේකම්වරු.

06-496

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව සන්ටෙල් ලිමිටඩ් සමග ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2012 මැයි 15 වැනි දින සිට ඒකාබද්ධ වූ බවට 244 (1) (අ) වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීමේ සහතිකය ප්‍රකාරව කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි.

ඒකාබද්ධ වූ සමාගමේ නම : ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ඒකාබද්ධ වූ සමාගමේ ලිපිනය : අංක 475, යුනියන් පෙදෙස, කොළඹ 02
ඒකාබද්ධ වූ දිනය : 2012 මැයි 15
ඒකාබද්ධ වූ සමාගම් ලියාපදිංචි අංකය : පී වී 261.

ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

විරන්ති ආටිගල,
සමාගමේ ලේකම්වරිය.

2012 මැයි මස 15 වැනි දින දී ය.

06-519

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : ඇමරේසියන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 86117
ලියාපදිංචි කළ දිනය : 2012.05.23
කාර්යාල ලිපිනය : අංක 61/9, ධර්මපාල මාවත, කොළඹ 03.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ, හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

06-520

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මොරටුව, ද සොයිසාපුර, අංක ආර් 1/10 හි පදිංචි විනිප්‍රිඩා පෙලිසියා මැරියන් වන මා විසින් රද්දොළුගම ජාතික නිවාස යෝජනා ක්‍රමය, අංක 7එෆ්/21 හි පදිංචි සුබසිංහ ආරච්චිගේ නිශාන්ත පෙරේරා යන අය වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. සී. විජේසිංහ විසින් 2007.10.06 දින හා අංක 5197 යටතේ ලියා සහතික කරන ලද හා කොළඹ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 17 වැනි කාණ්ඩයේ 1428 වැනි පත් ඉරුවේ දිනපොත් අංක 6151 යටතේ 2007.10.19 දින දී ලියාපදිංචි කර ඇති සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසුව ඇය විසින් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඇය වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශකර සිටිමි.

විනිප්‍රිඩා පෙලීසියා මැරියන්.

06-557

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීමයි.

සමාගමේ පෙර නම : ඩෙල්මේජ් ෆෝසයිත් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 3439
ලියාපදිංචි කාර්යාලය : අංක 101, විනයලංකාර මාවත, කොළඹ 10
සමාගමේ අලුත් නම : ග්‍රිප් ඩෙල්මේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සමාගම් ලේකම්.

06-459

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

"ද ස්මාර්ට් මයික්‍රො ක්‍රෙඩිට් සොලුයුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නමින් ලියාපදිංචි අංක පී වී 78137 යටතේ 2011.04.01 දින සමාගමක් ලියාපදිංචි කර ඇති බවත්, එහි ලියාපදිංචි කාර්යාලය අංක 410/ඒ5, කිරිල්ලවල, කඩවත යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන බවත් මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

අනුරාධ පලිහවඩන,
අධ්‍යක්ෂ.

2012 මැයි මස 28 වැනි දින.

06-462

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනයයි.

තැප්‍රොබාන් පැවිලියන් (පීවීටී) එල්ටීඩී 2012 මැයි මස 02 වැනි දින ලියාපදිංචි අංක පී වී 85744 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : තම්බපන්නි රෙට් රීට්, යද්දෙහිමුල්ල පාර, උණවටුන.

ජෝතිරත්න කදිරහෙට්ටිආරච්චි,
ලේකම්.

06-473

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමයි.

සමාගමේ නම : වූෆ් ඇන්ඩ් ඉනෝවේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 81134
ලියාපදිංචි ලිපිනය : අංක 400/40 එම්, බුළුගහවත්ත, ඉහළ බියන්විල, කඩවත
ලියාපදිංචි දිනය : 2011. 09.07.

06-471

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු:-

සමාගමේ නම : ග්‍රීන් මෙඩිකෙයා හොස්පිට්ල් (පීවීටී) එල්ටීඩී
සමාගම ලියාපදිංචි අංකය : පී වී 75525
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 213, නව නගරය, ඇඹිලිපිටිය
සමාගම ලියාපදිංචි කළ දිනය : 2010.11.16.

06-613/1

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු:-

සමාගමේ නම : හෙලිකොම් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 64698
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 1526/2/සී, කටුකුරුන්ද, කොට්ටාව, පන්නිපිටිය
සමාගම ලියාපදිංචි කළ දිනය : 2008.07.04.

06-613/2

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු:-

සමාගමේ නම : සී එස් එල් කන්සල්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 85724
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 32/3, ෆ්ලවර් රෝඩ්, කොළඹ 07
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.05.18.

06-613/3

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමයි.

සමාගමේ නම : මැට්රෝ ඉංජිනියරිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 67860
ලියාපදිංචි ලිපිනය : අංක 381 ඒ, ඇඹුල්ගම පාර, පනාගොඩ, හෝමාගම
ලියාපදිංචි කළ දිනය : 2009 මැයි 21

ලේකම්.

06-645

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැනුම් දීමයි.

සමාගමේ නම : ලීනා මැනුපැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 76003
ලියාපදිංචි ලිපිනය : අංක 334, ටී. බී. ජයා මාවත, කොළඹ 10
ලියාපදිංචි දිනය : 2010.12.10.

ලේකම්.

06-630

---

### 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනයයි

තම්බපන්නි ලෙෂර් මැනේජ්මන්ට් (පීවීටී) එල්ටීඩී 2012 අප්‍රේල් මස 30 වැනි දින ලියාපදිංචි අංක පී වී 85706 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : තම්බපන්නි රෙට් රීට්, යද්දෙහිමුල්ල පාර, උණවටුන.

ජෝතිරත්න කදිරහෙට්ටිආරච්චි,
ලේකම්.

06-615

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ අංක 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත සඳහන් විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :-

1. සමාගමේ නම : සීමාසහිත මාගම ප්‍රබෝධා ගමනැගුම ජනතා සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 4746
3. සංස්ථාගත කළ දිනය : 2011 ජුනි 24
4. ලියාපදිංචි ලිපිනය : මාගම, තිස්සමහාරාමය.

සමාගම් ලේකම්.

2011 ජූලි මස 08 වැනි දින.

06-637

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2012 ජූලි මස 04 වැනි දින පෙරවරු 11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගින්තොට පිහිටි වැලිවවත්ත ඉඩමෙහි බෙදා වෙන් කරන ලද ඉතිරි කොටස නොහොත් වැලිවත්ත ඉඩමෙහි ලොට් 3, 4 සහ 5 හි ලොට් 2 හි ලොට් 2 බී හි ලොට් 2බී 1 සහ 2 බී 2 යන එකිනෙකට යාබදව පිහිටි ඒකාබද්ධ කරන ලද ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එච්. එස්. විතානාච්චි විසින් මැන සාදන ලද අංක 1153 සහ 2007 නොවැම්බර් මස 10 දිනැති සැලැස්මෙහි ලොට් සී වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු වැවිලි ආදී සියලු දේ වේ.

(ප්‍රමාණය : අක්. 0, රූ. 0, පර්. 23)

2. ඉහත කී ගින්තොට පිහිටි වැලිවවත්ත ඉඩමෙහි බෙදා වෙන් කරන ලද ඉතිරි කොටස නොහොත් වැලිවත්ත ඉඩමෙහි ලොට් 3, 4 සහ 5 හි ලොට් 2 හි ලොට් 2 බී හි ලොට් 2 බී 1 සහ 2 බී 2 යන එකිනෙකට යාබදව පිහිටි ඒකාබද්ධ කරන ලද ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එච්. එස්. විතානාච්චි විසින් මැන සාදන ලද අංක 1153 සහ 2007 නොවැම්බර් මස 10 දිනැති සැලැස්මෙහි ලොට් ඩී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු වැව්ලි ආදී සියලු දේ වේ.

(ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 9.7)

අංක 1153 දරන සැලැස්මෙහි ලොට් ඊ මත මාර්ග අයිතිය ද සමගින් වේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් මන්සූර් මරික්කාර් විසින් ලියා සහතික කරන ලද අංක 10794 සහ 2008.06.20 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම මොහමඩ් සිද්දීක් මොහමඩ් මුනාෆර් සහ අබ්දුල් හකීම් ෆාතුමා නස්ලියා හෙවත් අබ්දුල් හකීම් සිත්ති නස්ලියා බන්ධනදායියන් වශයෙන් ද අබ්දුල් හකීම් ෆාතුමා නස්ලියා හෙවත් අබ්දුල් හකීම් සිත්ති නස්ලියා උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.09.16 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම සහ සුඩර් ඔලි යන පුවත්පත් සහ 2010.09.17 වැනි දින *ගැසට් පත්‍රය* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- ගාල්ල නගරයේ සිට කොළඹ දෙසට කි. මී. 5.5 පමණ පැමිණි විට ගින්තොට හන්දියෙන් දකුණට හැරී උක්වත්ත පාරේ කි. මී. 1.5 පැමිණි විට මහගෙදරවත්ත හන්දියෙන් වමට ඇති අතුරු පාරේ මීටර් 200 පමණ පැමිණ දකුණට ඇති බොරලු පාරේ මීටර් 50 පමණ පැමිණි විට විකිණීමට ඇති දේපළ දකුණ අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය:-

1. ගැනුම් මුදලේ 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු, නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 011-2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 011- 2871184.

06-636

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ද කැන්ඩි ටයර් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0029 3000 3215.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2011 මාර්තු මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත්කෝටි අනූනම ලක්ෂ දසදහසක (රු. 7,99,10,000) මුදල ද, 2010 ජනවාරි 11 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්කෝටි පනස් ලක්ෂයක (රු. 7,50,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට (අවම 16%) සියයට දෙකයි දශම පහක් (2.5%) + Average Weighted Prime Lending Rate බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරන වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2011.08.12 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2011.07.27 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2012.07.06 දින පෙ. ව. 9.30 - 1089 ට මරදාන පාර, බොරැල්ල, කොළඹ 08, ප. ව. 3.00 ට කොටුගොඩැල්ල වීදිය, නුවර පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ මහනුවර පිහිටි කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 106ඒ දරන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. කේ. එම්. එම්. වැලිවිට යන අය විසින් සාදන ලද 1982 ඔක්තෝබර් මස 02 දාතම හා අංක 1904 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2, නැගෙනහිරට : ලොට් 2, දකුණට : කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 104 දරන පරිශ්‍රයන් වෙන්කරන කාණුව සහ බස්නාහිරට : කොටුගොඩැල්ල වීදිය වෙන්කරන පදික වේදිකාව යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම පහයි හයයි දෙකක් (අ. 0 රූ. 0 පර්.1.562) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1904 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව 333/218 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී මහනුවර පිහිටි කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 106 දරන, අංක 1904 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 108 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට: තාප්පය, දකුණට : කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 104 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : කොටුගොඩැල්ල වීදිය වෙන් කරන පදික වේදිකාව යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 7.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1904 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව 400/01 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 819, 2860 සහ 204 ප්‍රකාර හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාවන් තුළ බොරැල්ල උතුර මරදාන වෝඩ් අංක 33 පිහිටි ඥාණාර්ථ ප්‍රදීප මාවත වරිපනම් අංක 29 (කලින් වරිපනම් අංක 1089) දරන ඉඩමට බලයලත් මානක තැන වී. සිත්සබේසන් යන අය විසින් සාදන ලද 1990 සැප්තැම්බර් මස 13 දාතම හා අංක 1099 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් X1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : වරිපනම් අංක 1 දරන පරිශ්‍රයත් සහ පාර්ක් ඇවනිව් ගිණිකොණට : පාර්ක් ඇවනිව් නිරිතට : ඥාණාර්ථ ප්‍රදීප මාවත සහ වයඹට : ලොට් X1A1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හයයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 11.62) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1099 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 1042/163 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 1252, 2863 සහ 202 ප්‍රකාර හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

06-639

---

## ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය

1. මහේන්ද්‍ර ප්‍රියන්ත ද සිල්වා වැලිහිඳ
   අංක 612/4, පහත, ඇඹිල්ලවත්ත පාර,
   බොරලැස්ගමුව

2. අජිත් යෝගේන්ද්‍ර ද සිල්වා වැලිහිඳ
   අංක 12/2ඒ, ලුම්බිණි මාවත,
   රත්මලාන

පැමිණිලිකරුවන්.............................

-එදිරිව-

නඩු අංකය : 525/05/P

1. කුටිල හරීන්ද්‍ර ද සිල්වා වැලිහිඳ
   ඩොල්ෆින් මෝටර්ස්,
   අංක 234 ඒ, ගාලු පාර, ගල්කිස්ස

2. අතුල පුණේන්ද්‍ර ද සිල්වා වැලිහිඳ
   අංක 12/2ඒ, ලුම්බිණි මාවත,
   රත්මලාන

විත්තිකරුවන්................................

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව 2007 ඔක්තෝබර් මස 26 වැනි දින දරන අතුරු තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන්ට හා විත්තිකරුවන්ට හිමි කොටස් සඳහා වූ උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2012 ක් වූ ජුනි මස 25 වැනි දින පෙ. ව. 11.30 පැයට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්කිස්සේ කොට්ඨාස අංක 16, විද්‍යාලය හා ගාලු පාරේ වරිපනම් අංක 234ඒ දරන ස්ථානයේ පිහිටි බංගලාවත්ත නම් ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. එස්. එස්. පොන්නම්පෙරුම මහතා විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 02 වැනි දින මැන සාදන ලද ලොට් අංක 01 දරන ඉඩම් කට්ටිය නම් වූ,

*උතුරට* : ගාලු පාරේ වරිපනම් අංක 232 දරන ඉඩම ද,
*නැගෙනහිරට* : ගාලු පාර ද,
*දකුණට* : ගාලු පාරේ වරිපනම් අංක 234 දරන ඉඩම ද,
*බස්නාහිරට* : හෝටල් පාර ද,
යන මායිම් තුළ පිහිටි පර්චස් පහලොව (අ. 0, රූ. 0 පර්. 15)ක් නොහොත් හෙක්ටයාර් 0.03794ක් විශාල ඉඩම සහ ඒ තුළ වරිපනම් අංක 234 ඒ දරන තෙමහල් ගොඩනැගිල්ල ද වේ.

මෙම අතුරු තීන්දු ප්‍රකාශයේ පිටපතක් ලියාපදිංචිය සඳහා නුගේගොඩ/දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවා ඇත.

*දේපළ වෙත පිවිසීම.* - ගාලු පාරේ ගල්කිස්ස දිසා අධිකරණයේ සිට කොළඹ දෙසට මීටර් 200ක් පමණ ගිය විට ගාලු පාරට මුහුණ ලා වම් පසට වන්නට වරිපනම් අංක 234 ඒ දරන දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%,
2. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 5000,
3. විකුණුම් කොන්දේසි සකස් කිරීම 3,000,
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු සහ ගමන් ගාස්තු
5. පළාත්පාලන ගාස්තු වශයෙන් 1%
6. ලිපිකරු සීනුව නාද කරන්නා හා සෝෂක ගාස්තු රු. 4,500,
7. ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුලත දී ගල්කිස්ස දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

ඉන්දු හේවාවිතාරණ,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු වෙන්දේසිකරු, සාම විනිසුරු.

අංක එච්. 1/16, සාංචි ආරච්චිවත්ත මහල් නිවාස,
කොළඹ 12
දුරකථන අංක 072- 4459575/072-2580932.

06-646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.